දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ 2013/38

මගේ අංකය :- බ12/08/වා.භා.ස/2013
බන්ධනාගාර මූලස්ථානය,
2013-10-21.

සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන්,
සහකාර බන්ධනාගාර අධිකාරීන්.

<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ - 2013 වර්ෂය</u>
<u>2014 ජනවාරි 15 වන දිනට පෙර භෞතික පරීක්ෂණය සහ 2014 ජනවාරි 29 දිනට පෙර සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම.</u>

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේඅංක PF/FS/භා.ස/01 හා 2009.12.09 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ 441 පරිදි වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය පහත පරිදි නිම කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

1. 2014.01.15 දිනට පෙර භෞතිකව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම.
2. 2014.01.29 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලබා ගැනීම.
3. 2014.02.17 දිනට පෙර ඌනතා හා අතිරික්ත සසදා වාර්තා කිරීම.
4. 2014.02.26 දිනට පෙර විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම,අළුත් වැඩියා කළයතු භාණ්ඩ අළුත්වැඩියාව හා වෙන්දේසි කළයුතු භාණ්ඩ වෙන්දේසි කර අවසන්කිරීම.
5. 2014.03.17 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපතිට හා 2006.07.30 දින දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ 422 අනුව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් හා අනෙකුත් අදාල ආයතන වෙත වාර්තා කිරීම.

මෙයට අමතරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් පහත සදහන් කර ඇති ලිපි හා චක්‍ර ලේඛ පිළිබදව ද දැඩි අවධානය යොමු කරණ මෙන් කාරුණිකව දන්වමි.

| | | |
|---|---|---|
| ▪ දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ | - 2008/54 | - 2008-12-14 |
| ▪ දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ | - 2008/57 | - 2008-12-24 |
| ▪ දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ | - 2008/58 | - 2008-12-24 |
| ▪ දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ | - 2008/59 | - 2008-12-24 |
| ▪ ලිපි | -බ12/08/වා.භා.ස.08 | - 2008-12-04 |

තව ද ,

- 2013 වසර අවසන් වන තුරු නොසිට අදාල ආකෘතිපත්‍ර ලබාගෙන නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී නිම කළ හැකි සියළුම කටයුතු නිම කිරීමට අදාල උපදෙස් ලබාදෙන්න.සාමාන්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අමතරව කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමට අදාලව භාණ්ඩ සමීක්ෂණයේදී ද භාණ්ඩාගාර 66 ආකෘතියේ සම්පූර්ණ කර තිබිය යුතුවේ. තව ද සුභසාධක ගිණුමට අදාලව ආකෘති වෙනම සකස් කළ යුතුවේ.
- පිටපත් 05 කින් සකස් කරණ ලද භාණ්ඩාගාර 66 ආකෘතිපත් වලින් එක් පිටපතක් බන්ධනාගාර කොමසාරිස්(මුදල්) වෙත 2014 ජනවාරි 05 වැනි දිනට පෙර යොමු කළ යුතු වේ.
- මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන අමතර ලිඛිත උපදෙස් බන්ධනාගාර කොමසාරිස්(මුදල්) විසින් අවශ්‍ය අවස්ථාවන් හිදී අදාල නිලධාරීන්ට ලබාදීමට කටයුතු කළ යුතු වේ.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

පිටපත්:- 01. විගණකාධිපති.
02. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්.